# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 අගෝස්තු මස 07 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 අගෝස්තු මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 19.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 15.00 යි.

**2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2013 අගෝස්තු මස 07 වැනි දින]

එල්.ඩී.—ඕ. 21/2009.

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලිබල පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2009 අංක 20 දරන පනතේ 2වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් මේ පනත මගින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමන ලද හෝ පවරන ලද සියලු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම කරනු ලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් පැවරීම.

2අ. (1) (අ) කොමිෂන් සභාව විසින් මේ පනත මගින් හෝ ඒ යටතේ එයට පිරිනමන ලද හෝ පවරන ලද එහි බලතල, කාර්ය සහ කර්තව්‍යයන් කිසිවක් කොමිෂන් සභාවේ යම් නිලධරයකුට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කිසියම් නිශ්චිත අරමුණක් සහ කාලසීමාවක් සඳහා පවරනු ලැබිය හැකි ය ;

(ආ) කොමිෂන් සභාව විසින් මේ පනතේ 1 වන උපලේඛනයේ අයිතම 3,4,5 හා 6 මගින් ඒ වෙත පවරන ලද බලතල කිසිවක් යම් ප්‍රාදේශීය ලේකම්වරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල, කාර්යය හෝ කර්තව්‍යයන් කිසිවක් පවරනු ලැබ ඇත්තේ යම් නිලධරයකුට ද ඒ නිලධරයා විසින් ඒ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ඒ නිලධරයාට දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද යම් බලතල, කාර්යය හෝ යම් කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට කොමිෂන් සභාවට අධිකාරී බලය තිබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ ''එවැනි තැනැත්තකු එම උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයට අනුකූලවීම අවශ්‍ය වන්නේ ය.'' යන වචන වෙනුවට ''එවැනි තැනැත්තකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන අවස්ථාවක දී ඒ තැනැත්තා එම උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයට අනුකූලවීම අවශ්‍ය වන්නේ ය.'' යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(1අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම, මේ

පනත බලාත්මක වන දිනයේ දී උත්පාදන ධාරිතාව මෙ. වො. 25 ඉක්මවා සහ අභිබවා විදුලිය උත්පාදනය කිරීම පිණිස පිරියතක් ක්‍රියාත්මක කරන, මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුව ම වූ දින ක්‍රියාත්මක වන, ලංකා විදුලිබල මණ්ඩලය සමග ලියා අත්සන් කරන ලද විදුලි බලය මිලට ගැනීමේ වලංගු ගිවිසුමක් දරන සමාගමකට අදාළ කර නොගත යුතු ය :

එසේ වුවද, මේ උපවගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි සමාගමක් සම්බන්ධයෙන් අවශ්‍ය සුදුසුකම අදාළ කර නොගැනීම ඒ උපවගන්තියේ සඳහන් කරන ලද විදුලි බලය මිලට ගැනීමේ ගිවිසුම බලපවත්නා කාලසීමාව තුළ දී පමණක් ක්‍රියාත්මක විය යුතු ය.''; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ ''ආණ්ඩුව විසින් සියයට පනහට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන'', යන වචන වෙනුවට ''ආණ්ඩුව විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් සියයට පනහට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන'', යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තිය ලෙස බලාත්මකව පැවතිය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

''ව්‍යවස්ථාපිත නිදහස් කිරීම්. 9අ. (1) කොමිෂන් සභාව විසින්,

(අ) විදුලිය උත්පාදනය සඳහා පිළිගත් සැකසුම් ;

(ආ) උත්පාදනය කිරීමට යෝජිත විදුලිබල ප්‍රමාණය ;

(ඇ) උත්පාදනය කළ විදුලි බලය බෙදා හැරිය යුතු තැනැත්තන් සංඛ්‍යාව;

(ඇ) විදුලිය උත්පාදනය සඳහා භාවිතා කරනු ලබන පිරියතෙහි පිහිටීම ; සහ

(ඉ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිර්ණායක,

සැලකිල්ලට ගනිමින් යම් තැනැත්තකු වාණිජමය නොවන පදනමක් මත ප්‍රජා මූලික විදුලි උත්පාදන ව්‍යාපෘතියක යෙදී සිටින අවස්ථාවක දී ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් එසේ විදුලිය උත්පාදනය කිරීම හෝ බෙදාහැරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් එවැනි යම් තැනැත්තකු හෝ තැනැත්තන් ගණයක් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) ඒ නිදහස් කිරීම ප්‍රදානය කරනු ලබන්නේ යම් කාල සීමාවකට ද ඒ කාලසීමාව සහ ඒ නිදහස් කිරීම යටත් විය යුතු නියමයන් සහ කොන්දේසි ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයට විය යුතු ය.

(3) යම් තැනැත්තකු හෝ තැනැත්තන් ගණයක් විසින් :—

(අ) ප්‍රදානය කළ නිදහස් කිරීම යටත්වන යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය වන පරිදි ක්‍රියාකර ඇති අවස්ථාවක දී ; හෝ

(ආ) වාණිජමය පදනමක් මත විදුලිය උත්පාදනය කිරීම හෝ බෙදාහැරීම ආරම්භ කර ඇති අවස්ථාවක දී,

(1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තාට හෝ තැනැත්තන් ගණයට ප්‍රදානය කර ඇති නිදහස් කිරීම කොමිෂන් සභාව විසින් ඉල්ලා අස්කරගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති නිදහස් කිරීමක් ඉල්ලා අස්කරගෙන ඇති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන යම් ආකාරයකින් කොමිෂන් සභාව විසින් ගැසට්

පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිදහස් කිරීම ඉල්ලා අස්කරගනු ලැබූ තැනැත්තාගේ හෝ තැනැත්තන් ගණයේ නම් හෙළිදරව් කළ යුතු අතර ඒ ඉල්ලා අස්කර ගැනීම බලපෑ හැකි තැනැත්තන්ට ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබිය යුතු ය.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්"යන වචන වෙනුවට "තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ නිදහස් කිරීමක් ප්‍රදානය කර ඇත්තේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් ගණයකට ද ඒ සෑම තැනැත්තකුට ම හෝ තැනැත්තන් ගණයකට කොමිෂන් සභාව විසින් යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු නිදහස් කිරීමේ සහතිකයක් ප්‍රදානය කළ යුතු අතර එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කාල සීමාවක් සඳහා බලාත්මක විය යුතු ය.";

(3) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) යම් තැනැත්තකුට හෝ තැනැත්තන් ගණයකට (2) වන උපවගන්තිය යටතේ නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කර සතියක් ඇතුළත ඒ නිදහස් කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබුවේ අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකුට හෝ තැනැත්තන් ගණයකට ද ඒ සියලු තැනැත්තන්ගේ හෝ තැනැත්තන් ගණවල නම් ගැසට් පත්‍රයේ දැන්වීමක් මගින් පළ කිරීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු ය :

එසේ වුව ද, නියම කරන ලද කාලසීමාවක් තුළ ඉහතින් නියම කර ඇති කිසිදු දැන්වීමක් ගැසට් පත්‍රයේ පළකර නොමැති නම් (2) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන

ලද නිදහස් කිරීමේ සහතිකයක් ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර කිසිදු බලාත්මකභාවයක් හෝ නීත්‍යානුකූලභාවයක් නොපැවතිය යුතු ය.";

(4) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"ඉල්ලීමක් මත ප්‍රදානය
කරනු ලබන
නිදහස් කිරීම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ආආ) යම් සහාධිපත්‍ය දේපලක හෝ අර්ධ සහාධිපත්‍ය දේපලක සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ට විදුලි බලය බෙදා හැරීමට අරමුණු කරන යම් බලපත්‍රලාභියකුට 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ පිහිටුවන ලද අවස්ථාවෝචිත පරිදි ඒ සහාධිපත්‍ය දේපලෙහි හෝ අර්ධ සහාධිපත්‍ය දේපලෙහි කළමනාකරණ සංස්ථාව සමග ගිවිසුමකට ඇතුළත්ව, විදුලි බලය පරිභෝජනය කිරීම සඳහා ඒ සියලු අයිතිකරුවන්ගෙන් සේවා ගාස්තු සහ මාසික ගාස්තු අයකර ගැනීමට ඒ කළමනාකරණ සංස්ථාවට බලය දෙමින් ඒ අයිතිකරුවන්ට විදුලි බලය සැපයීමට බලපත්‍රලාභියාට නියම කෙරෙන;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් පැවරුමකට බලය දෙමින් වූ කොන්දේසියක් බලපත්‍රයක ඇතුළත් වී ඇත්නම්, බලපත්‍රයකට සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පැවරුමක් කිරීමේ හැකියාවක් ඇත." ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) (3) වන උපවගන්තියෙන් පනවන ලද නියමයන්ට කොමිෂන් සභාව අනුකූල වී ඇති බවට සහ ඒ අපේක්ෂිත පැවරුම මගින් මේ වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය නොකරන බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී ඒ පැවරුම සඳහා ඔහුගේ කැමැත්ත ප්‍රදානය කළ යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "10 වන වගන්තිය යටතේ "යන වචන සහ ඉලක්කම් වෙනුවට "9අ සහ 10 වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ අවසානයට පසුව පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3) කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් (අ) ඡේදය යටතේ නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද සියලු තැනැත්තන්ගේ හෝ තැනැත්තන් ගණයේ නම් හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිදහස් කිරීම ඉල්ලා අස්කරගත් තැනැත්තන් ගණයේ යම් තැනැත්තකුගේ නමත් ප්‍රසිද්ධියට පත් කළ යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) 25 වන වගන්තිය යටතේ විදුලි බලය සැපයීමක් අවශ්‍ය වන යම් තැනැත්තකුට විදුලි බලය සම්බන්ධ කිරීමේ සහ සැපයීමේ කාර්යය සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා

විසින් යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සපයනු ලැබ ඇති අවස්ථාවක, අදාළ තැනැත්තා වෙත ඒ මාර්ගය හෝ පිරියත හෝ විදුලිබල සම්බන්ධතාවය සහ සැපයුම සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් කිසිවක්, බෙදාහැරීමේ බලපත්‍රයේ කොන්දේසි මගින් අවකාශ දී ඇත්තා වූ යම් ප්‍රමාණයකින් ඒ තැනැත්තා විසින් පියවිය යුතු යයි ඒ බලපත්‍රලාභියා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.''; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(1අ) 25 වන වගන්තිය යටතේ විදුලි බලය සැපයීමක් අවශ්‍ය වන යම් තැනැත්තකුට, (1) වන උපවගන්තිය යටතේ බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් දරන ලද වියදම් පියවීමට ප්‍රමාණවත් මුදලක් නොමැති අවස්ථාවක දී සම්මත අයකුම ගිවිසුමකට අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් පනවන ලද ගාස්තු සහ වෙනත් යම් අයකිරීම් සමග සාධාරණ මාසික වාරිකවලින් ඒ වියදම අයකර ගැනීමේ පදනම මත ආදාළ පරිශ්‍රයට විදුලිබල සම්බන්ධතාවය සහ විදුලිබල සැපයුම ලබා දෙන ලෙසට ඒ තැනැත්තා විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(1ආ) විදුලි මාර්ගය හෝ විදුලි පිරියත හෝ විදුලි සම්බන්ධතාවය සහ විදුලිබල සැපයුම අදාළ පරිශ්‍රයට සැපයීමට පෙරාතුව (1අ) උපවගන්තියේ සඳහන් කරන ලද පරිදි යම් තැනැත්තකුට බලපත්‍රලාභියා විසින් දරන ලද සම්පූර්ණ වියදම පියවීමට ප්‍රමාණවත් මුදලක් නොමැති බවට බෙදාහැරීමේ බලපත්‍රලාභියා සෑහීමකට පත්වන අවස්ථාවක දී, බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අදාළ පරිශ්‍රයට විදුලි මාර්ගය හෝ විදුලි පිරියත හෝ විදුලි සම්බන්ධතාවය සහ විදුලි බලය සැපයීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පෙරාතුව ඒ තැනැත්තාගෙන් වියදම අයකර ගත හැකි ආකාරය සම්බන්ධයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභියා සමග ගිවිසුමකට එළඹෙන ලෙසට ඔහුට නියම කරනු ලැබිය යුතු ය.

(1ඇ) ඒ බලපත්‍රලාභියා විසින් දරන ලද යම් වියදමක් අයකර ගැනීමට ප්‍රමාණවත් මුදලක් ඒ තැනැත්තාට නොමැති බවට (1ආ) උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සෑහීමට පත්වීමේ කාර්යය සඳහා, බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කරනු ලබන තොරතුරු නියම කරනු ලැබිය යුතු මාර්ගෝපදේශ මත පදනම් විය යුතු ය.''.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(2අ) (2) වන උපවගන්තිය යටතේ යම් ආරවුලක් බේරුම්කර නිරවුල් කිරීමේ දී කොමිෂන් සභාව විසින් එසේ කිරීම සුදුසු යයි එය තීරණය කරන අවස්ථාවක දී ඒ ආරවුල නිරවුල් කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ නැතහොත් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ රජයේ නිලධරයකු වන ඒ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු එක් අයකු ද ඇතුළුව කොමිෂන් සභාව විසින් පත්කළ තැනැත්තන් තුන්දෙනකුගෙන් සමන්විත සමථ මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබිය හැකි ය. සමථ මණ්ඩලය විසින් එය වෙත යොමු කරන ලද ආරවුල විසඳීමට සහ ආරවුලට සම්බන්ධ පාර්ශවයන් අතර සමථයක් ඇති කිරීමට සෑම ප්‍රයත්නයක් ම ගත යුතු අතර කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කාලසීමාවක් ඇතුළත ඒ විචාරය අවසන් කළ යුතු ය.''; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''විය යුත්තේ'' යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

''මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද රීතිවලට අනුව විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නව උත්පාදන පිරියතක් සැපයීම හෝ යම් පවත්නා පිරියතක් දීර්ඝ කිරීම.

43. (1) මේ පනතේ 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිදු තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් බලය දී ඇත්නම් මිස, යම් නව උත්පාදන පිරියතක් සැපයීම හෝ ක්‍රියාත්මක කිරීම නැතහොත් පවතින පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීම කරගෙන යාම නොකළ යුතු ය.

(2) සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියකු විසින්, ඔහු විසින් සකස් කරන ලද දීර්ඝ කාලීන අඩුම පිරිවැය උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමේ නිශ්චිතව සඳහන් කර ඇති අනාගත ඉල්ලුම පිළිබඳ අනාවැකි මත පදනම්ව සහ බෙදාහැරීමේ සහ උත්පාදන බලපත්‍රලාභීන්ගේ ඉදිරිපත් කිරීම් සලකා බැලීමෙන් පසු කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති එහි සංශෝධන පරිදි අලුත් උත්පාදන පිරියතක් ලබා ගැනීමේ වැඩ පිළිවෙලකට හෝ පවතින පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ යෝජනා කොමිෂන් සභාවේ ලිඛිත අනුමතය සඳහා එය වෙත ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුව ද, මේ පනත බලාත්මක වීමට පෙරාතුව ම වූ දිනයේ,

(අ) අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබාගෙන තිබෙන ; හෝ

(ආ) අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීම හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් ඇති

වී තිබෙන, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් මාර්ගයෙන් විදුලි බලය උත්පාදනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, ලබාගත් අනුමතය හෝ නිකුත් කළ අවසර පත්‍රය කොමිෂන් සභාවේ අනුමතය සඳහා කොමිෂන් සභාව වෙත යොමුකරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම හා ඒ සමග ඉදිරිපත් කර ඇති යම් ලියකියවිලි සලකා බැලීමෙන් පසුව හා මේ පනත ක්‍රියාත්මක වීමට පෙර අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමතය ලබාගෙන ඇති බවට හෝ සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අවසර පත්‍රයක් නිකුත් කර ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට අවස්ථාවෝචිත පරිදි අලුත් උත්පාදන පිරියතක් ලබා ගැනීමට හෝ පවතින පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට අනුමතය ප්‍රදානය කළ යුතු ය.

(3) මේ පනතේ 13 වන වගන්තිය යටතේ ධාරිතාව මෙගාවොට් 25ට අඩු විදුලිබල ශක්තියක් උත්පාදන කිරීමට බලපත්‍රයක් නිකුත් කර ඇති යම් තැනැත්තකු, ධාරිතාව මෙගාවොට් 25 ට වැඩි විය හැකි විදුලිබල උත්පාදනයක් සිදුවන පරිදි එහි උත්පාදන පිරියතේ උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට යෝජනා කරන අවස්ථාවක දී, ඒ යෝජනාව සඳහා (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අනුමතය, ඒ තැනැත්තා උත්පාදන බලපත්‍රයක් නිකුත් කිරීමට මේ

පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වේ නම් මිස ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අනුමතය ලබා ගැනීමෙන් පසුව, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ඔහුගේ සම්ප්‍රේෂණ බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූලව සහ සැපයීමට අදාළව කොමිෂන් සභාව විසින් සාදනු ලැබිය හැකි කිසියම් රීතියකට අනුකූලව ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් අවස්ථාවෝචිත පරිදි දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු පරිදි අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කිරීමෙන් පසු ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය :—

(අ) කොමිෂන් සභාව විසින් නිසි ආකාරයෙන් අනුමත කර මේ පනත බලාත්මකභාවයට පත්වන දිනයට පෙරාතුව ම වූ දිනයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති සහ අඩුම පිරිවැයකින් ක්‍රියාත්මක කිරීමට නියම කර ඇති අඩුම පිරිවැයක් මත දීර්ඝ කාලීන උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව;

(ආ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයන් මාර්ගයෙන් විදුලි බලය උත්පාදනය කිරීම සඳහා නිකුත් කරන ලද සහ සම්මත අයක්‍රම ක්‍රියාත්මක කිරීමට නියම කරන ලද සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්මත විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමක් මගින් පාලනය වන අවසරයක් මත; හෝ

(ඇ) (i) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති විදේශීය ස්වෛරී රාජ්‍යයකින් ශ්‍රී ලංකා රජයට ලැබුණු යෝජනාවක් ; හෝ

(ii) යහපත් විය හැකි බලපැවැත්මෙන් වැඩි ක්‍රියා පද්ධතියක් සඳහා ටෙන්ඩර් කැඳවීම කල්ගතවන හෝ අඩුම පිරිවැයකට යම් තැනැත්තකු විසින් සැපයීමට අවශ්‍ය හදිසි අවස්ථාවක ධාරිතාව ලබා දීමේ අවස්ථාවක දී ජාතික ව්‍යසනයක දී හෝ ප්‍රධාන උත්පාදන පිරියතක විදුලි බලය ක්‍රියාවිරහිත වීම දීර්ඝ කාලීනව බලපාන කාලය තුළ දී අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් හදිසි අවස්ථා තත්ත්වයක් සඳහා ක්‍රියා කිරීමේ පදනම මත-

අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී තිබෙන්නා වූ කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබාගනිමින් කොමිෂන් සභාව විසින් නිසි ලෙස අනුමත කරන ලද අඩුම පිරිවැය දීර්ඝ කාලීන උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව වැඩිදියුණු කරනු ලබන යම් අලුත් උත්පාදන පිරියතක් හෝ යම් පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම සම්බන්ධයෙන් අදාළ කරගනු නොලැබිය යුතු ය.

(5) ටෙන්ඩර් භාරගැනීමෙන් පසුව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් නිසි ආකාරයෙන් සංස්ථාපනය කරන ලද ටෙන්ඩර් මණ්ඩලය මාර්ගයෙන් කොමිෂන් සභාවේ අනුමතය සඳහා—

(අ) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ තාක්ෂණික හා පිරිමැසුම්දායී පරාමිතීන්ට අනුකූලව (4) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අවස්ථාවෝචිත පරිදි අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට;

(ආ) අඩුම පිරිවැයකට විදුලි ශක්තිය හෝ විදුලිය උත්පාදනය කිරීමේ ධාරිතාව විකිණීමට; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් නිසි ආකාරයෙන් අනුමත කරන ලද

අඩුම පිරිවැය දීර්ඝ කාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලසුමේ අවශ්‍යතාවයන් සපුරාලන වඩාත්ම සුදුසුකම් ඇති තැනැත්තා පිළිබඳව,

විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ කෙටුම්පත සමග ඒ මිලදී ගැනීමේ නියමයන් සහ කොන්දේසි විස්තර කරමින් කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(6) (අ) (4) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ කිසියම් තැනැත්තකු ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමෙන් නිදහස් කිරීම; හෝ

(ආ) මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹෙන දින සිට බලපවත්වන්නා වූ අනුමතයක් වන අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබාගෙන ඇති තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් නිසි ලෙස අනුමත කළ අඩුම පිරිවැය දීර්ඝ කාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව සංවර්ධනය කර ඇති අලුත් උත්පාදන පිරියතක් හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීම,

යන කරුණු නොසලකා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ තාක්ෂණික හා පිරිමැසුම්දායී පරාමිතීන්ට අනුකූලව ඒ තැනැත්තා අවස්ථාවෝචිත පරිදි අලුත් උත්පාදන පිරියතක් සංවර්ධනය කිරීම හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට හැකියාවක් ඇති සහ අඩුම පිරිවැයකට විදුලිබල ශක්තිය හෝ විදුලිය උත්පාදන ධාරිතාව අලෙවි කිරීමට හැකියාවක් ඇති තැනැත්තකු බවට සෑහීමට පත්වීම පිණිස එම අදාළ තැනැත්තා සමග සාකච්ඡා කිරීමට සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට නියම

කරනු ලැබිය යුතු අතර විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ කෙටුම්පත හෝ සම්මත විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ කෙටුම්පත සමග අවස්ථාවෝචිත පරිදි ඒ මිලදී ගැනීමේ නියමයන් හා කොන්දේසි විස්තර කරමින් කොමිෂන් සභාවේ අනුමතය සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(7) අවස්ථාවෝචිත පරිදි (5) වන උපවගන්තිය හෝ (6) වන උපවගන්තිය යටතේ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ කිසියම් නිර්දේශ ලැබුණු පසුව, විදුලිබල ශක්තිය හෝ විදුලිබල උත්පාදන ධාරිතාව මිලදී ගැනීම සඳහා නිර්දේශිත මිල ගණන් අඩුම පිරිවැය මූලධර්මය සහ අඩුම පිරිවැය දීර්ඝ කාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලසුමේ නියමයන් සපුරාලන බවට සහ ඒ මිලදී ගැනීමේ නියමයන් සහ කොන්දේසි බලපත්‍රලාභීයාගේ පිළිගත් තාක්ෂණික සහ පිරිමැසුම්දායී පරාමිතීන් අනුව පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් හැකිතාක් ඉක්මණින් ඒ සඳහා එහි අනුමතය ප්‍රදානය කරනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්යය සඳහා:—

"අඩුම පිරිවැය දීර්ඝකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලසුම" යන්නෙන්, අවම පිරිමැසුම්දායී පිරිවැය පදනම මත නිශ්චය කරන ලද අනාගත විදුලිබල උත්පාදන ධාරිතා අවශ්‍යතාවයන් දක්වමින් සහ කොමිෂන් සභාව විසින් නිසි ආකාරයෙන් අනුමත කර කලින් කලට ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුලිබල පද්ධතියේ තාක්ෂණ සහ විශ්වසනීය අවශ්‍යතාවයන් සපුරාලමින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභීයා විසින් සකස් කරන ලද සහ බලපත්‍රලාභීන්

විසින් සැලකර සිටීමේ පදනම මත කොමිෂන් සභාව විසින් සංශෝධනය කර අනුමත කරන ලද සහ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද සැලසුමක් අදහස් වේ; සහ

"සම්මත විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම" යන්නෙන්, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් භාවිතා කරමින් උත්පාදනය කරන ලද විදුලිබල ශක්තිය හෝ විදුලිබල උත්පාදන ධාරිතාව මිලදී ගැනීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ඇතුළත් වූ ගිවිසුමක් අදහස් වේ.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "සෑම තැනැත්තකුම; හෝ" යන වචන වෙනුවට "සෑම තැනැත්තකුම;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "සෑම තැනැත්තකුම" යන වචන වෙනුවට "සෑම තැනැත්තකුම ; හෝ"; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඇ) හිතාමතාම හෝ නොසැලකිලිමත්ව:—

(i) බලපත්‍රලාභී බෙදාහරින්නකු විසින් කිසියම් පරිශ්‍රයකට සපයන ලද විදුලිබල ප්‍රමාණය මැනීම සඳහා භාවිතා කරන යම් මීටරයක් මත සටහන් වී ඇති විදුලිබල ප්‍රමාණය වෙනස් කරනු ලබන සෑම තැනැත්තකු ම; හෝ

(ii) යම් මීටරයක් හරහා සපයන ලද විදුලිබල ප්‍රමාණය එම මීටරයේ නිසි ලෙස සටහන් වීම වලක්වනු ලබන සෑම තැනැත්තකු ම,

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වරදක් සඳහා යම් තැනැත්තකු චෝදනා ලැබ ඇති අවස්ථාවක දී—

(i) චෝදනා ලබන තැනැත්තාගේ භාරය හෝ පාලනය යටතේ එම මීටරය පැවති බවට; සහ

(ii) එම මීටරය මත සටහන් වී ඇති විදුලිබල ප්‍රමාණයේ සටහන වෙනස් කිරීමට හේතුවන පරිදි එම මීටරයේ අනවසර වෙනස්කම් සිදුකර ඇති බවට සහ ඒ අනුව භාවිතය පිළිබඳ නිසි ආකාරයෙන් මීටරයේ සටහන් වීම වැලැක්වීම පිළිබඳ පැහැදිලි සාක්ෂි පවත්නා බවට,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂි ලෙස ආවේශ්‍ය කරගනු ලැබිය යුතු අතර, එහි ඇතුළත් කාරණා පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(4අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ පරිශ්‍රයට සපයා ඇති විදුලිබල සැපයුම විසන්ධි කරනු ලැබිය හැකි අතර වරද සිදු කරනු ලැබුවේ යම් මීටරයක් අදාළ කරගෙන ද ඒ මීටරය ඉවත් කර ඉන්පසුව එය බැහැර කිරීමට බලපත්‍රලාභියාට කොමිෂන් සභාව විසින් බලය දෙන තෙක් ඒ මීටරය ආරක්ෂිත භාරයේ

තබනු ලැබිය හැකි ය. තව ද, නොගෙවන ලද ගාස්තු බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අයකර ගන්නා ලද අවස්ථාවක දී, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, සාධාරණ කාලසීමාවක් තුළ දී එසේ විසන්ධි කරනු ලැබූ විදුලිබල සැපයුම ප්‍රකෘති තත්ත්වයට පත් කරනු ලැබිය යුතු ය.".

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අමාත්‍යවරයා විසින් අනුකූලභාවය පිළිබඳ සහතික වීම.

57. අමාත්‍යවරයා විසින්, මේ පනතේ අවස්ථාවෝචිත පරිදි 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අවශ්‍ය පරිදි, ඔහුගේ එකඟත්වය ලබා දීමේ දී නියම කළ යුතු යයි වූ යම් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.".

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මධ්‍යම පාරිසරික අධිකාරිය" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"ලංකා විදුලිබල මණ්ඩලය" යන්නෙන්, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය අදහස් වේ ;";

(2) "විදුලි පිරියත " යන යෙදුමෙන් දැක්වෙන අර්ථනිරූපණයේ දී, ඒ අර්ථනිරූපණයේ (අ), (ආ), සහ (ඇ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(අ) විදුලි රැහැනක්; හෝ

(ආ) පාරිභෝගිකයකුගේ පාලනය යටතේ ඇති යම් විදුලි උපකරණයක්,"

(3) "අධි වෝල්ටියතා මාර්ගය" යන යෙදුමෙන් දැක්වෙන අර්ථනිරූපණයේ "කිලෝවොට් 33 ට නොඅඩු" යන වචන ඉවත් කර ඒ වෙනුවට "කිලෝවොට් 33 ට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) "දැන්වීම" යන වචනයේ අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්:—

"විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම" යන්නෙන්. බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට විදුලි බලශක්තිය විකිණීමේ කාර්යය සඳහා පමණක්ම විදුලිබල ශක්තිය තොග වශයෙන් හෝ විදුලි උත්පාදන ධාරිතාව තොග වශයෙන් මිලදී ගැනීම සඳහා විදුලි උත්පාදන බලපත්‍රලාභියකු සමග සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් එළඹුන ගිවිසුමක් අදහස් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ 3 වන අයිතමයේ —

(අ) එම අයිතමයේ (3) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(3) (1) වන හෝ (2) වන ඡේද අදාළ වන සහ—

(අ) මාර්ග අවසරයක් ලබා ගැනීම සුරක්ෂිත කර ගැනීම පිණිස බලපත්‍රලාභියකු විසින් සියලුම සාධාරණ ප්‍රයත්න රැගෙන ඇති; සහ

(ආ) එම ප්‍රයත්න අසාර්ථක වී ඇති අවස්ථාවක,

අවස්ථාවෝචිත පරිදි ඉඩම උඩින් මාර්ග අවසරය ඉල්ලා ඇති ඉඩම හෝ සවිකර ඇති විදුලි මාර්ගයන් ඒ ඉඩමෙන් ඉවත් කිරීමට ඉල්ලා සිටින ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, අදාළ

බලපත්‍රලාභියා විසින් තත්කාර්ය සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර සති හයක් ඇතුළත, සහ :—

(i) අදාළ ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමට පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව; සහ

(ii) බලපත්‍රලාභියාට ඔහුගේ බලපත්‍රයෙන් කරගෙන යාමට බලය දෙන ලද කාර්යයන් කරගෙන යෑම පිණිස බලපත්‍රලාභියාට අදාළ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉඩම මතින්, ඉඩම උඩින් හෝ ඉඩම යටින් විදුලි මාර්ගයක් සවිකිරීම සහ සවිකර පවත්වාගෙන යාම අවශ්‍යවන බවට සහ යෝග්‍යවන බවට සෑහීමට පත්වීමෙන් පසුව,

කොන්දේසි විරහිතව හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන යම් පිරිවිතරයන්ට, කොන්දේසිවලට සහ නියමයන්ට යටත්ව සහ දෙයාකාරයෙන් එක් ආකාරයක් විය හැකි ක්‍රමයකට, අවස්ථාවෝචිත පරිදි, (1) වන හෝ (2) වන ඡේදයේ සඳහන් කරන ලද කාර්යයන් කරගෙන යාමට බලපත්‍රලාභියාට බලය දීම හෝ එම කාර්යයන් කරගෙන යාමෙන් බලපත්‍රලාභියා වැළැක්වීම කළ යුතු ය.

(3අ) පරීක්ෂණය අවසන් වීමෙන් පසුව බලපත්‍රලාභියාට බලපත්‍රයෙන් බලය දෙන ලද කාර්යයන් කරගෙන යාමේ කාර්යය සඳහා මාර්ග අවසරය අත්කර ගැනීම අවශ්‍යතාවක් බවට එළඹ ඇතැයි ප්‍රාදේශීය ලේකම්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් තත්කාර්ය සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර සති හයක් ඇතුළත, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එයට අදාළ ඔහුගේ නිර්දේශයන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. බලපත්‍රය යටතේ බලපත්‍රලාභියාට කරගෙන යාමට බලය දෙන ලද කාර්යයන් කරගෙන යාම පිණිස ඒ ඉඩම අත්කර ගැනීමට හෝ අදාළ ඉඩම මතින්, ඉඩම යටින් හෝ ඉඩම උඩින් විදුලි මාර්ගයක් සවිකිරීමට හෝ සවිකර පවත්වාගෙන යාමට අවශ්‍යයයි හෝ යෝග්‍යයයි කොමිෂන් සභාව සෑහීමට පත්වීමෙන් පසු එම අත්කර ගැනීම පිළිබඳ අමාත්‍යවරයා වෙත නිර්දේශය ඉදිරිපත් කළ යුතු ය. ඉන්පසුව, ගැසට්

පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර මාර්ග අවසරය ඉන් පසුව පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වූවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන බලපත්‍රලාභියාට පවරනු ලැබිය යුතු ය. ඒ අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් බලපත්‍රලාභියා විසින් ගෙවනු ලැබිය යුතු ය."; සහ

(ආ) එම අයිතමයේ (5) වන ඡේදය අත්හැරීමෙන්; සහ

(2) එම උපලේඛනයේ 6 වන අයිතමයේ:—

(අ) එම අයිතමයේ (4) වන ඡේදයේ "දින විසි එකක්" යන වචන වෙනුවට "වැඩ කරන දින හතක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම අයිතමයේ (5) වන ඡේදයේ "දින විසි එකක්" යන වචන වෙනුවට සහ "කොමිෂන් සභාව වෙත" යන වචන වෙනුවට පිළිවෙළින් "වැඩ කරන දින හතක්" යන වචන සහ "කොමිෂන් සභාව වෙත හෝ තත්කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් පත්කළ තැනැත්තකු වෙත" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම උපලේඛනයේ 1 වන අයිතමයේ (5) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(5) ගාස්තු ක්‍රම පාරිභෝගිකයකු විසින් —

(අ) යම් පරිශ්‍රයකට සපයන ලද විදුලි බලය වෙනුවෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අය විය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි

මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ වියදම් නියමිත කාලසීමාව තුළ දී නොගෙවුවහොත් ;

(ආ) බලපත්‍රලාභියා විසින් වෙනත් යම් පාරිභෝගිකයකුට දී ඇති සැපයුමට අනිසි ලෙස හෝ අනුචිත ලෙස මැදිහත් වන යම් මෙවලමක් භාවිත කිරීම නවත්වන ලෙස නියම කරමින් බලපත්‍රලාභියාගෙන් ලත් දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් ; හෝ

(ඇ) පනතේ 27 වන වගන්තියේ (1ආ) උපවගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමක් යටතේ නියමිත කාලසීමාවක් සඳහා අයවිය යුතු මාසික වාරික හෝ පාරිභෝගිකයා විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභියාට ගෙවීමට පොරොන්දු වී ඇති වෙනත් යම් ගාස්තු ගෙවීම පැහැර හැරියහොත්,

නියමිත කාලසීමාව අවසානයේ දී ඒ පරිශ්‍රයට දී ඇති සැපයුම හෝ පාරිභෝගිකයා පදිංචිව සිටින වෙනත් යම් පරිශ්‍රයකට වූ සැපයුම බලපත්‍රලාභියා යෝග්‍යයයි කල්පනා කරන මාර්ගයකින් කපා හැර එසේ කිරීමේ යම් වියදමක් පාරිභෝගිකයාගෙන් අයකර ගත යුතු ය.".

(ආ) එම උපලේඛනයේ 5 වන අයිතමයේ (1) වන ඡේදයේ "8 වන අයිතමයේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම්වල සිට "ඕනෑම පරිශ්‍රයකට ඇතුල් විය හැකි ය:– යන වචන දක්වා ඉවත් කර" II වන උපලේඛනයේ 8 (1) (අ) අයිතමයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නියෝග මගින් නියම කරන ලද පරිදි බෙදාහැරීම බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද යම් නිලධරයකු, පහත දැක්වෙන කාර්යවලින් කවරක් හෝ සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අයිති හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි මාර්ගය හා විදුලි පිරියත හරහා බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් පෙ. ව. 8 සිට ප. ව. 5 දක්වා විදුලි සැපයුම ලබාදෙන ඕනෑම පරිශ්‍රයකට ඇතුල් විය හැකි ය:—'' යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපලේඛනයේ 6 වන අයිතමයේ—

(i) (1) වන ඡේදයේ, "8 වන අයිතමයට යටත්ව," යන වචන සහ ඉලක්කම් වල සිට "පරිශ්‍රයට ඇතුල් විය හැකි ය." යන වචන දක්වා ඉවත් කර "බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දී ඇති යම් නිලධරයකු විසින් විදුලි සැපයුම විසන්ධි කිරීමේ කාර්ය සඳහා හෝ විදුලිය බෙදාහැරීම හෝ සැපයීම හා සම්බන්ධ කාර්ය සඳහා භාවිත කරන ලද මීටරය හෝ යම් ආශ්‍රිත විදුලි පිරියතක් ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා හෝ පෙ.ව. 8 සිට ප.ව. 5 දක්වා; පරිශ්‍රයට ඇතුල් විය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) (2) වන ඡේදයේ "8 වන අයිතමයට යටත්ව" යන වචන සහ ඉලක්කම්වල සිට "පරිශ්‍රයට ඇතුල් විය හැකි ය." යන වචන දක්වා ඉවත් කර "සැපයුම විසන්ධි කිරීමේ හෝ යම් විදුලි පිරියතක්, විදුලි මාර්ගයක් හෝ විදුලි මීටරයක් ඉවත් කිරීමේ කාර්ය සඳහා හෝ පෙ.ව. 8 සිට ප.ව. 5 දක්වා පරිශ්‍රයට ඇතුල් විය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

(ඈ) එම උපලේඛනයේ 8 වන අයිතමයේ (1) වන ඡේදයේ "මේ පනත යටතේ" යන වචන ඉවත් කර "II වන උපලේඛනයේ 5 වන සහ 6 වන අයිතමවල විධිවිධාන යටතේ හැර, මේ පනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උප ලේඛනය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන උපලේඛනය එහි 8 වන අයිතමය අත්හැරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**21.** මේ පනතේ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධන සියලු කාර්යයන් සඳහා 2009 අප්‍රේල් මස 8 වන දින සිට බලාත්මකභාවයට එළඹ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.